# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 Fax +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/21/06
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2024.07.01

**සියලුම පත්වීම්ලාභීන් වෙත**

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

**<u>දිවයිනේ ජාතික පාසල්වල පවතින සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම 2023 (2024)</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 2359 හා 2023.11.17 දිනැති ගැසට් නිවේදනය අනුව 2024.03.02 දින විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණයේ හා 2024 අප්‍රේල් 29,30 හා මැයි 02,03,04,06,07,08,09 දිනයන්හි අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව පවත්වන ලද ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු වල එකතුවේ ප්‍රමුඛතාව අනුව **අ.පො.ස.උ.පෙළ ගණිතය,විද්‍යාව, තාක්ෂණවේදය,විදේශ භාෂා,ඉංග්‍රීසි හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය යටතේ** වන විෂයයන් සඳහා ගුරු පත්වීම් ලබාදීම සඳහා ඔබ තෝරා ගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ අනුව ඔබ වෙත පත්වීම් ලිපි ප්‍රදානය කිරීමේ උත්සවය **2024.07.03 වෙනි බදාදා දින පෙ.ව.09.00** ට අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් **අරලියගහ මන්දිරයේදී** පැවැත්වීමට නියමිතය. එබැවින් එම උත්සවයට සහභාගී වීම සඳහා ඔබ එදින පෙ.ව.07.00 වන විට ජාතික හැඳුනුම්පත රැගෙන **ගංගාරාම විහාරස්ථානය (බේරේවැව) අසල පිහිටි ඇතුළුවීමේ දොරටුවෙන් පමණක්** අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාව වෙත ප්‍රවිශ්ට විය යුතු වේ.(ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය සහතික කළ හැකි ලේඛනයක් රැගෙන ඒම අනිවාර්ය වේ.)

03. **පිරිමි පත්වීම්ලාභීන් කළු කලිසම, සුදු කමිසය සැරසිය යුතු අතර කාන්තා පත්වීම්ලාභීන් සුදු හෝ ක්‍රීම් පැහැයෙන් යුතු සාරියකින් හෝ ඔසරියකින් සැරසී පැමිණිය යුතුය.**

04. එදිනට **ඔබ වෙත ලබා දෙන අංකය අනිවාර්යයෙන්ම ඇඳුමේ වම් පස ඉහළින් පැළඳිය** යුතු අතර පත්වීම් ප්‍රදාන උත්සවයේ කටයුතු අවසන් වනතුරු ශාලාවේ රැඳී සිටිය යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

05. මෙම උත්සවය සඳහා පත්වීම්ලාභීන් පමණක් සහභාගී විය යුතු අතර වෙනත් කිසිදු පුද්ගලයෙකු උත්සව ශාලාව වෙත රැගෙන යාමට අවසර දෙනු නොලැබේ.

06. මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

මෙයට - විශ්වාසී,

ජේ.ජේ.එස්.එස්.එදිරිසූරිය
අතිරේක ලේකම් ( ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට.

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/21/06

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.07.01

அனைத்து நியமனதாரர்களுக்கும்,

**நாட்டின் தேசிய பாடசாலைகளில் நிலவும் சிங்களம், தமிழ் மற்றும் ஆங்கில மொழி மூல ஆசிரியர் வெற்றிடங்களுக்கு பட்டதாரிகளை இலங்கை ஆசிரியர் சேவையின் தரம் 3-1 (அ) இற்கு ஆட்சேர்த்தல் 2023(2024)**

மேற்படி விடயம் தொடர்பில் பிரசுரிக்கப்பட்ட இலக்கம் 2359 மற்றும் 2023.11.17ம் திகதியுடைய வர்த்தமானி அறிவித்தலுக்கமைய 2024.03.02ம் திகதியன்று பரீட்சை ஆணையாளர் நாயகத்தால் நடாத்தப்பட்ட எழுத்து மூலப் பரீட்சை மற்றும் 2024 ஏப்ரல் மாதம் 29, 30 மற்றும் மே மாதம் 02, 03, 04, 06, 07, 08, 09 ஆகிய திகதிகளில் கல்வி அமைச்சினால் பொது நேர்முகப் பரீட்சை ஒன்றை நடாத்தியதன் பின்னர் நடாத்தப்பட்ட பிரயோகப் பரீட்சைப் புள்ளிகளின் கூட்டுத்தொகையின் முன்னுரிமை அடிப்படையில் க.பொ.த உயர் தர **கணிதம், விஞ்ஞானம், தொழில்நுட்பம், வெளிநாட்டு மொழிகள், ஆங்கிலம் மற்றும் 13 வருட தொடர் கல்வியின் கீழுள்ள பாடங்களுக்கு** ஆசிரியர் நியமனம் வழங்குவதற்காக தாங்கள் தெரிவு செய்யப்பட்டுள்ளீர்கள் என்பதை மகிழ்ச்சியுடன் தெரிவித்துக் கொள்கின்றேன்

02. அதற்கமைய தங்களுக்கு நியமனக் கடிதங்களை வழங்குவதற்கான வைபவம் **2024.07.03ம் திகதி புதன் கிழமை மு.ப 09.00** மணிக்கு அதிமேதகு ஜனாதிபதியின் தலைமையில் **அலரி மாளிகையில்** நடாத்தப்படவுள்ளது. ஆகையால் குறித்த வைபவத்தில் கலந்துகொள்வதற்காக தாங்கள் அன்றைய தினம் மு.ப 07.00 மணிக்கு தேசிய அடையாள அட்டை சகிதம் கங்காராமை விகாரைக்கு **(பேரே வாவி) அண்மையில் அமைந்துள்ள நுழைவாயிலூடாக** மாத்திரம் அலரி மாளிகையின் பிரதான மண்டபத்தினுள் பிரவேசித்தல் வேண்டும். (தேசிய அடையாள அட்டை அல்லது அடையாளத்தை உறுதிப்படுத்தக்கூடிய ஆவணம் ஒன்றை கொண்டுவருவது கட்டாயமாகும்)

03. ஆண் நியமனதாரர்கள் கருப்பு நிற நீளக் கால் சட்டை, வெள்ளை நிற மேல் சட்டை அணிதல் வேண்டும் என்பதுடன் பெண் நியமனதாரர்கள் வெள்ளை அல்லது கிரீம் நிறத்திலான சேலை அல்லது ஒசரி அணிந்து வருகை தரல் வேண்டும்.

04. அன்றைய தினத்தில் **தங்களுக்கு வழங்கப்படும் இலக்கத்தை கட்டாயமாக தங்களது உடையின் இடது பக்கத்தின் மேல் புறமாக அணிதல்** வேண்டும் என்பதுடன் நியமனம் வழங்கும் வைபவத்தின் அனைத்து செயற்பாடுகளும் நிறைவடையும் வரையில் மண்டபத்தினுள் தரித்திருத்தல் வேண்டும் என்பதையும் தயவுடன் தெரிவித்துக் கொள்கின்றேன்.

05. இவ் வைபவத்தில் நியமனதாரர்கள் மாத்திரமே கலந்துகொள்ள வேண்டும் என்பதுடன் வேறு எந்தவொரு நபரையும் வைபவ மண்டபத்தினுள் அழைத்து வருவதற்கு அனுமதி வழங்கப்படமாட்டாது.

06. இதற்கான பிரயாணச் செலவினங்கள் அல்லது வேறு ஏதும் கொடுப்பனவுகள் வழங்கப்படமாட்டாது.

இப்படிக்கு - நம்பிக்கைக்குரிய,

ஏ.ஜே.எஸ்.எஸ் எதிரிசூரிய
மேலதிக செயலாளர் (தாபனம்)
கல்வி அமைச்சின் செயலாளருக்காக